ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනවේදී (ස්වාභාවික විද්‍යා) උපාධිය - 5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2008

තුලනාත්මක අධ්‍යාපනය හා අධ්‍යාපනික ගැටළු - **ESU 3213**

කාලය පැය තුනයි.

---

දිනය - 2008.08.29 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

පළමු වන කොටසේ සියළුම ප්‍රශ්නවලටද 2 වන කොටසින් ප්‍රශ්න තුනකට ද පිළිතුරු සපයන්න.

## <u>පළමු වන කොටස</u>

01. ශ්‍රී ලංකාවේ පැරණි පිරිවෙන් විෂයමාලාවට ඇතුළත් වූ විෂය ක්ෂේත්‍ර පහක් නම් කරන්න.

02. ලන්දේසීන් විසින් ස්ථාපනය කරන ලද 'නෝමල් පාසලේ' ප්‍රධාන කාර්යය කෙටියෙන් දක්වන්න.

03. අධ්‍යාපනය බහුතර පිරිසක් වෙත ව්‍යාප්ත කරවීම සම්බන්ධයෙන් මෝර්ගන් කමිටුව ඉදිරිපත් කළ නිර්දේශ කෝල්බෲක් කොමිසම ඉදිරිපත් කළ නිර්දේශ සමග සසඳන්න.

04. 1961 ජාතික අධ්‍යාපන කොමිසම ඉදිරිපත් කළ නිර්දේශ දෙකක් නම් කරන්න.

05. අනිවාර්ය අධ්‍යාපන නිෂ්ටාව ඉටු කර ගැනීමේ දී ශ්‍රී ලංකාව මුහුණ දෙන බාධක තුනක් නම් කරන්න.

06. සිසුන්ගේ අධ්‍යාපන ප්‍රාප්තිය කෙරෙහි සමාජ පන්තියේ බලපෑම අවම කර ගැනීම උදෙසා එක්සත් රාජධානිය විසින් 19 වන සියවස මැද භාගයේ දී හඳුන්වා දෙන ලද ක්‍රියා මාර්ග තුනක් දක්වන්න.

07. වර්තමාන ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය කෙරෙහි ඇති වී ඇති ජාත්‍යන්තර බලපෑම් තුනක් දක්වන්න.

08. සාර්ක් කලාපය තුළ මතු වී ඇති සාමාන්‍ය අධ්‍යාපන ගැටළු පහක් නම් කරන්න.

( 5 x 8 =ලකුණු 40)

## දෙවන කොටස

09. (i) ශ්‍රී ලංකාවේ රාජ්‍ය සභා යුගයේ දී සිදු කළ ප්‍රධාන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පහක් කෙටියෙන් දක්වන්න.

(ලකුණු 05)

(ii) ඒවා අතුරින් අධ්‍යාපනයේ සම අවස්ථා ලබාදීම සඳහා දායක වූ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ දෙකක් තෝරා ගෙන, එම ප්‍රතිසංස්කරණ එම අවධියේ දී අත්‍යවශ්‍ය වූයේ කුමක් නිසාද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(iii) මෙම ප්‍රතිසංස්කරණ එම අවධියේ සමාජයීය සංවර්ධනය සම්බන්ධයෙන් වැදගත් වූ ආකාරය තක්සේරු කරන්න.

(ලකුණු 07)

10. (i) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සමාජයීය හා ආර්ථික අවශ්‍යතා සඳහා අදාළ කරවීම සඳහා 1977 දී ජ්‍යෙෂ්ඨ ද්විතියික මට්ටමේදී යෝජනා කළ විෂයමාලා ප්‍රතිසංස්කරණ මොනවා ද?

(ලකුණු 10)

(ii) රටේ සමාජයීය හා ආර්ථික සංවර්ධනය කෙරෙහි මෙම ප්‍රතිසංස්කරණ වල අදාළත්වය ගැන ඔබේ අදහස් දක්වන්න.

(ලකුණු 10)

11. (i) 'බහු - සංස්කෘතික අධ්‍යාපනය' යන යෙදුම නිර්වචනය කරන්න.

(ලකුණු 05)

(ii) ලෝකයේ බොහෝ රටවලට 'බහු- සංස්කෘතික සමාජ සඳහා අධ්‍යාපනය' යන්න අභියෝගයක් වී ඇත්තේ කුමක් නිසා ද?

(ලකුණු 05)

(iii) ශ්‍රී ලංකාවේ ප්‍රජාවන් අතර ඒකීයත්වය වර්ධනය කිරීම උදෙසා විධිමත් පාසල් පද්ධතිය තුළ බහු- සංස්කෘතික අධ්‍යාපනය තුළින් ක්‍රියාත්මක කළ හැකි උපාය මාර්ග පහක් කෙටියෙන් දක්වන්න.

(ලකුණු 10)

12. (i) සංවර්ධිත රටවල දක්නට ඇති නව ප්‍රවණතා පහක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ii) මෙම ප්‍රවණතා ඇති වීමට හේතු වූ සාධක සාකච්ඡා කරන්න.

(ලකුණු 07)

(iii) මෙම ප්‍රවණතා වලින් සමාජය කෙරෙහි ඇති විය හැකි බලපෑම විභාග කරන්න.

(ලකුණු 08)

13. "නව අධ්‍යාපන පද්ධතීන් සංවර්ධනය කිරීමට යත්න දරණ සංවර්ධනය වෙමින් පවතින රටවල් කෙරෙහි ගෝලීයකරණය තුළින් වාසි මෙන්ම අවාසි ද සිදු වී ඇත."

(i) ගෝලීයකරණය තුළින් උද්ගත වී ඇති වාසි හා අවාසි දෙක බැගින් හඳුනා ගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii) ඔබ ඒවා වාසි හා අවාසි ලෙස වර්ගීකරණයෙහි යෙදෙන්නේ මන්ද ? පැහැදිලි කරන්න.

(ලකුණු 10)

14. පහත දැක්වෙන මාතෘකා අතුරින් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) කෝල්බෘක් කොමිසම ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ නිර්දේශ.

(ii) ජපානයේ ද්විතීය අධ්‍යාපනයේ ප්‍රධාන ලක්ෂණ.

(iii) අධ්‍යාපනයේ සාධාරණත්වය පිළිබඳ ගැටළු සම්බන්ධයෙන් එක්සත් රාජධානිය ගෙන ඇති පියවර

( 10 x 2 =ලකුණු 20)

\- **හිමිකම් ඇවිරිණි.** -